දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක ..........06............../2017

කේ05/05/චක්‍රලේඛ/25/2017
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2017.01.15 වන දින,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් හා සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් වෙත,

**<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිළධාරීන් පරීක්ෂණ කටයුතු සඳහා බන්ධනාගාර ආයතන වෙත ඇතුල් වීම.</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිළධාරීන් විමර්ශණ කටයුතු සඳහා බන්ධනාගාර වෙත ඇතුල්වීමට පැමිනීමේදී එම දොරටු වලදී අනිසි ප්‍රමාදයක් සිදුවන බවත්, පරීක්ෂණ සඳහා අවශ්‍ය මෙවලම් බන්ධනාගාරය තුලට රැගෙන යාමට නොහැකි වීමෙන් අපහසුතාවයට පත්වන බවත්, එම කොමිෂමේ ලේකම් විසින් මා වෙත ලිඛිතව දන්වා ඇත.

එම නිසා මින් ඉදිරියට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිළධාරීන් පරීක්ෂන සඳහා බන්ධනාගාර ආයතන වෙත පැමිනීමේදී පහත සඳහන් අයුරින් කටයුතු කරන ලෙස දන්වමි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආයතන ප්‍රධානියා වෙත අවශ්‍යතාවය සඳහන් කරමින් ඉදිරිපත් කරන විධිමත් ලිපියට අනුව අදාල කටයුත්ත සඳහා පැමිනෙන එම කොමිෂමේ නිළධාරීන්ගේ නිල හැඳුනුම්පත් සමග ජාතික හැඳුනුම්පතද, සමග සසඳා බලා අනන්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුය.

අදාල නිළධාරීන්ට ඇතුලත් වීම සඳහා මූලික අවසරය ලබාදීම එම අවස්ථාවේදී රාජකාරියේ යෙදී සිටින ජේලර්වරයා විසින් සිදුකල යුතු අතර, ඒ පිළිබඳව අප්‍රමාදව බන්ධනාගාර අධිකාරීවරයාගේ අවධානයට යොමුකර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.

එම විමර්ශණ සඳහා මානව හිමිකම් කොමිෂමේ නිළධාරීන්ට අවශ්‍යතාවය අනුව පටිගත කිරීමේ උපකරණ, කැමරා, භාවිතා කිරීමට අවසරය ලබාදෙමි. අදාල විමර්ෂණය ජේලර්වරයෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ අඛන්ඩව සිදු කල යුතුය.

එච්.එම්.එන්.සී ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.